සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර III විභාගය - 2026 ජනවාරි

(302) කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය

(Management Accounting & Finance)

2026-02-08
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
උත්තර ලිවීම සඳහා - පැය 03 යි.

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) ***ගණිතමය වගු*** *සපයනු ලැබේ.*

(8) *ලකුණු 100.*

A කොටස

(මුළු ලකුණු 20)

01 වන ප්‍රශ්නය

සීමාසහිත Pix සමාගම, P නිෂ්පාදිතය නිපදවා අලෙවි කරනු ලබන අතර, පහත සඳහන් තොරතුරු **P නිෂ්පාදිතයේ** ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් උපුටාගන්නා ලදී:

	ඒකකයකට (රු.)
විකුණුම් මිල	3,000
සෘජු ද්‍රව්‍ය	1,200
සෘජු ශ්‍රමය	950
විචල්‍ය පොදුකාර්ය	320

මාසික අයවැයගත ස්ථාවර පොදුකාර්ය, රු.4,200,250/- කි.

මාසික අයවැයගත නිෂ්පාදනය / විකුණුම් ඒකක ගණන 30,000 කි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) සමච්ඡේදන ලක්ෂ්‍යය [Break Even Point (BEP)] ඒකකවලින්. (ලකුණු 03)

(b) අයවැයගත විකුණුම් ප්‍රමාණයේදී, මාසය සඳහා අපේක්ෂිත ලාභය. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

02 වන ප්‍රශ්නය

සීමාසහිත Emmy සමාගම, X නිෂ්පාදිතයෙහි නිෂ්පාදකයෙක් සහ තොග වෙළෙන්දෙක් වේ. **සීමාසහිත Emmy සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන තිබේ:

(රු.'000)

මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	**2025**	**2024**
විකුණුම්	21,300	19,800
විකුණුම් පිරිවැය	13,000	12,276

මාර්තු 31 දිනට	**2025**	**2024**
තොගය	1,172	906
වෙළෙඳ ලැබිය යුතු මුදල්	3,550	3,266
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	2,570	2,110

සියලුම විකුණුම් සහ ගැනුම්, ණය පදනම මත සිදුකරයි.

ඔබ විසින් කළ යුතු දෑ:

සීමාසහිත Emmy සමාගමේ, 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කාරක ප්‍රාග්ධන චක්‍රය (Working Capital Cycle) *(දිනවලින්)* **ගණනය කරන්න.** (ලකුණු 05)

03 වන ප්‍රශ්නය

සමාගම් විසින් නිරන්තරයෙන් අධීක්ෂණය, විශ්ලේෂණය, පාලනය සහ තීරණ ගැනීම යන අරමුණු සඳහා අයවැය පාලන ප්‍රකාශනයන් පිළියෙළ කරනු ලබයි. මෙම ප්‍රකාශන මගින් ප්‍රතිපෝෂණ පාලනයන් (Feedback Control) සහ පෙරපෝෂණ පාලනයන් (Feedforward Control) යන දෙකම සපයනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) "ප්‍රතිපෝෂණ පාලනය" (Feedback Control) සහ "පෙරපෝෂණ පාලනය" (Feedforward Control) අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) අයවැයකරණ ප්‍රවේශයන් (approaches) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

04 වන ප්‍රශ්නය

සීමාසහිත Techno සමාගම, තම සේවාදායකයින්ගේ අවශ්‍යතාවය පරිදි (tailor-made) මෘදුකාංග විසඳුම් සංවර්ධනය කරන අතර, එම ව්‍යාපෘති (project) සඳහා බොහෝ දුරට කුලියට ගත් නිදහස් සේවකයින් (freelance staff) යොදවා ගනී.

සීමාසහිත Techno සමාගම, දැනට පවතින සමහර ව්‍යාපෘතියන්හි ප්‍රමාදයන්වලට මුහුණ දෙන අතර, පිරිවැය පියවා ගැනීම සඳහා කෙටිකාලීන ව්‍යාපෘති (short term projects) ලබා ගැනීමට උනන්දුවෙන් සිටී. මාස 4 කින් නිමවෙන පරිදි **සීමාසහිත Apple සමාගම** සඳහා තොග මොඩියුලයක් (inventory module) සංවර්ධනය කිරීම සඳහා **සීමාසහිත Techno සමාගමට** විමසීමක් ලැබී තිබේ. මෙම නව ව්‍යාපෘතිය සඳහා **සීමාසහිත Techno සමාගම** විසින් මිල කියුමක් (quotation) ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ.

මෙම කෙටිකාලීන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) මෙම ව්‍යාපෘතිය සඳහා වන මානව සම්පත් අවශ්‍යතාවය පහත සඳහන් පරිදි තක්සේරුකර ඇත:

කාර්යය මණ්ඩල අවශ්‍යතාවය	**පැය ගණන**	**පැයක් සඳහා සම්මත ගාස්තුව (රු.)**
මෘදුකාංග සංවර්ධකයින්	2,880	24,000
ව්‍යාපාර විශ්ලේෂක	224	9,000
පරීක්ෂකයින්	224	15,000
ව්‍යාපෘති කළමනාකරු	720	24,000

(2) මෙම ව්‍යාපෘතිය සඳහා මෘදුකාංග සංවර්ධකයින්ගේ මුළු කාර්ය මණ්ඩල අවශ්‍යතාවය බඳවා ගත යුතුය. දැනට සිටින මෘදුකාංග සංවර්ධකයින්ගේ අක්‍රීය පැය (idling hours) නොමැත.

(3) පවතින ව්‍යාපෘතිවල ප්‍රමාදය හේතුවෙන් වෙනත් ව්‍යාපෘති සඳහා බඳවාගෙන ගෙවීම් කළ සමහර පරීක්ෂකයින් දැනට වැඩක් නොමැතිව සිටී. අක්‍රිය පැය ගණන 150 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

(4) ව්‍යාපාර විශ්ලේෂක සහ ව්‍යාපෘති කළමනාකරු, මසකට පිළිවෙලින් රු.300,000/- ක් සහ රු.1,000,000/- ක මාසික වැටුපක් ලබන ස්ථිර කාර්යය මණ්ඩල සාමාජිකයින් වේ. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා දැනට සිටින ව්‍යාපාර විශ්ලේෂකට සහ ව්‍යාපෘති කළමනාකරුට ප්‍රමාණවත් නිදහස් කාලයක් (free time) පවතී.

(5) මෙම ව්‍යාපෘතිය සඳහා පිරිවැය රු. මිලියන 6 ක් වන නව බලපත්‍ර අවශ්‍යතාවයක් පවතී.

(6) මෙම ව්‍යාපෘතිය සඳහා දැරීමට සිදුවන අනෙකුත් පොදුකාර්ය, රු. මිලියන 1 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

(7) **සීමාසහිත Techno සමාගම,** මෙම ව්‍යාපෘතිය සඳහා මිල ලෙස රු.80,000,000/- ක් අයකරනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

සීමාසහිත Techno සමාගම, මෙම කෙටි කාලීන ව්‍යාපෘතිය බාරගත යුතුද නැද්ද යන්න **තක්සේරු කරන්න**.

(ඔබගේ උත්තරය ගණනය කිරීම් මගින් සනාථ කරන්න. එක් එක් පිරිවැය අදාලද, අදාල නොවේද යන්න සඳහන් කරන්න.)

(ලකුණු 05)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 30)

05 වන ප්‍රශ්නය

සීමාසහිත Heel සමාගම, සපත්තු නිෂ්පාදනය කර අලෙවි කරයි. සමාගමේ මෙහෙයුම් සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු දී ඇත.

(1) විකුණුම්වලින් 60% ක් දින 30 ක ණය කාලසීමාවක් යටතේ සිදු කරන අතර, ඉතිරිය මුදල් පදනම මත සිදු කරයි. 2025 දෙසැම්බර් සිට 2026 මාර්තු දක්වා අයවැයගත විකුණුම් පහත පරිදි වේ:

	25 - දෙසැ.	**26 - ජන.**	**26 - පෙබ.**	**26 - මාර්තු**
විකුණුම් (රු.)	20,400,000	16,000,000	8,000,000	11,000,000

(2) සෑම විටකදීම, විකුණුම් මත දායකත්ව අනුපාතය 30% ක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

(3) සෘජු ද්‍රව්‍ය පිරිවැය, මුළු විචල්‍ය පිරිවැයෙන් 60% කට සමාන වේ. නිෂ්පාදන කටයුතු පහසු කිරීම සඳහා විකුණුම්වලට මාස දෙකකට පෙර ද්‍රව්‍ය මිලට ගන්නා අතර, මේ සඳහා මිලදී ගත් දින සිට දින 60 ක ණය කාලයක් හිමි වේ.

(4) සෘජු ශ්‍රම පිරිවැය, මුළු විචල්‍ය පිරිවැයෙන් 15% කට සමාන වන අතර, විකුණුම් මාසය තුළදීම ඒ සඳහා ගෙවීම් සිදුකරනු ලැබේ.

(5) මුළු විචල්‍ය පිරිවැයේ ඉතිරි කොටස , අනෙකුත් විචල්‍ය පොදුකාර්ය වියදම් වේ. වෙනත් විචල්‍ය පොදුකාර්යවලින් 50% ක්, ඒවා දරණ මාසයේදී ගෙවනු ලබන අතර, ඉතිරි මුදල එය දැරීමෙන් පසු ඊළඟ මාසයේදී ගෙවනු ලැබේ.

(6) ස්ථාවර කාර්යය මණ්ඩල වැටුප් පිරිවැය මසකට රු. මිලියන 4 ක් වන අතර, එය දරණු ලබන මාසය තුළදීම ගෙවනු ලැබේ.

(7) 2025 වර්ෂයට අදාල කාර්යමණ්ඩල ප්‍රසාද දීමනාව වන රු. මිලියන 3.5, 2026 මාර්තු මාසයේදී ගෙවිය යුතුය.

(8) 2026 ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය රු.2,350,000/- කි.

(9) අතිරික්ත මුදල් වාර්ෂිකව 4% ක පොලියක් උපයන ඉතුරුම් ගිණුමක රඳවා තබා ගනු ලබයි. සෑම මසකම ආරම්භක ශේෂය මත පොලිය ගණනය කරනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2026 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු මාස සඳහා මුදල් අයවැය **පිළියෙල කරන්න.** (ලකුණු 10)

06 වන ප්‍රශ්නය

සීමාසහිත X පොදු සමාගම, විවිධ වර්ගයේ නිෂ්පාදිත තුනක් නිපදවා අලෙවි කිරීමේ යෙදී සිටී. පහත සඳහන් තොරතුරු, නිෂ්පාදිත තුනකට අදාලව ප්‍රමිත පිරිවැය පත්‍රිකාවලින් උපුටාගන්නා ලදී:

	රු. (ඒකකයකට)		
	P	Q	R
විකුණුම් මිල	2,400	5,000	6,000
සෘජු ද්‍රව්‍ය	1,000	1,800	2,000
සෘජු ශ්‍රමය:			
පුහුණු ශ්‍රමය (පැයකට රු.800/- බැගින්)	200	400	800
නුපුහුණු ශ්‍රමය (පැයකට රු.600/- බැගින්)	450	600	1,200
විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය	300	450	900
කාර්තුවක් සඳහා අයවැයගත විකුණුම් (ඒකකවලින්)	10,000	8,000	15,000

මීළඟ කාර්තුවේදී, ශ්‍රමය ලබාගැනීමේ හැකියාව පහත සඳහන් පරිදි ඇස්තමේන්තුගත කර ඇත:

පුහුණු ශ්‍රමය	පැය 23,000
නුපුහුණු ශ්‍රමය	පැය 40,000

ඔබ විසින් කළ යුතු දෑ:

(a) උපකාරක ගණනය කිරීම් සහිතව සීමාකාරී සාධකය / සාධක **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(b) හඳුනාගත් සීමාකාරී සාධකය / සාධක මත පදනම්ව, ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රය **ගණනය කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

07 වන ප්‍රශ්නය

සීමාසහිත Best පොදු සමාගම, කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගමක් වන අතර, පහත සඳහන් තොරතුරු **සීමාසහිත Best පොදු සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගන්නා ලදි:

(1) **සීමාසහිත Best පොදු සමාගම,** ඡන්ද හිමි සාමාන්‍ය කොටස් මිලියන 7 ක් එක් කොටසක් රු.100/- බැගින් නිකුත් කර ඇත. මෙම කොටස් වර්තමානයේදී කොටසක් රු.125/- බැගින් අලෙවි වන අතර, සමාගම විසින් පසුගිය මූල්‍ය වර්ෂය සඳහා කොටසකට රු.25/- ක ලාභාංශයක් ගෙවා ඇත. ලාභාංශ, වාර්ෂිකව 10% බැගින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(2) මූලික නිකුතුවේදී කොටසක් රු.60/- බැගින් නිකුත් කර ඇති ලැයිස්තුගත නිදහස් කළ නොහැකි වරණීය කොටස් මිලියන 8 ක් **සීමාසහිත Best පොදු සමාගම** සතුව ඇත. මෙම කොටස් වර්තමානයේදී කොටසක් රු.64/- බැගින් අලෙවි වේ. කොටසක වාර්ෂික ලාභාංශය රු.9.60 ක් වේ.

(3) සමාගම වාර්ෂිකව 14% ක කූපන් අනුපාතිකයක් (coupon rate) සහිත එකක් රු.100/- බැගින් වන ලැයිස්තුගත නිදහස් කළ හැකි ණයකර මිලියන 10 ක් නිකුත් කර ඇත. ණයකරයක වර්තමාන වෙළෙඳපොළ මිල රු.97/- කි. වර්ෂ 4 කින් මෙම ණයකර නිදහස් කෙරේ.

(4) සමාගම, වාර්ෂිකව 30% ක අනුපාතිකයකට ආදායම් බදු ගෙවීමට යටත් වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) සාමාන්‍ය ඡන්ද හිමි කොටස් පිරිවැය (Cost of Ordinary Voting Shares). (ලකුණු 02)

(b) නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය (Cost of Irredeemable Preference Shares). (ලකුණු 02)

(c) නිදහස් කළ හැකි ණයකර පිරිවැය (Cost of Redeemable Debentures). (ලකුණු 03)

(d) වෙළෙඳපොළ අගය භාවිතයෙන්, බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය [Weighted Average Cost of Capital (WACC)]. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස

(මුළු ලකුණු 50)

08 වන ප්‍රශ්නය

සීමාසහිත Tab සමාගම, නව නිෂ්පාදිතයක් නිෂ්පාදනය සඳහා නිෂ්පාදිත දෙකකින් (**A නිෂ්පාදිතය** හෝ **B නිෂ්පාදිතය**) එකක් තේරීමට ව්‍යාපෘති දෙකක් ආයෝජන අවස්ථා ලෙස තක්සේරු කරමින් සිටී.

ව්‍යාපෘති දෙකට අදාලව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) **A ව්‍යාපෘතිය:**

A නිෂ්පාදිතය නිපදවීම සඳහා රු. මිලියන 200 ක පිරිවැයෙන් යුතු නව යන්ත්‍රයක් අත්පත් කර ගැනීම හා මෙය සම්බන්ධ වේ. යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 ක් වන අතර, යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය තුළ පිරිවැය මත පදනම්ව, සරල මාර්ග ක්‍රමයට ක්ෂයවීම් ගණනය කරනු ලැබේ. බදු අරමුණු සඳහා යන්ත්‍රය මත වාර්ෂිකව 25% ප්‍රාග්ධන දීමනා (capital allowances) ලබා ගත හැකිය.

ඉදිරි වසර 5 සඳහා බදු පෙර ලාභය පහත පරිදි වනු ඇතැයි අපේක්ෂා කෙරේ: *(රු.)*

	1 වන වසර	2 වන වසර	3 වන වසර	4 වන වසර	5 වන වසර
බදු පෙර ලාභය	65,000,000	80,000,000	100,000,000	120,000,000	120,000,000

(2) **B ව්‍යාපෘතිය:**

මෙම ව්‍යාපෘතිය මඟින් නව **B නිෂ්පාදිතය** වෙළෙඳපොළ සඳහා නිපදවීම සිදු කරන අතර, නව යන්ත්‍රයක් සඳහා මූලික ආයෝජනයේ පිරිවැය රු. මිලියන 150 ක් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය වසර 4 කි. පළමු වසර තුළ ඒකකයක විචල්‍ය පිරිවැය රු.1,600/- ක් සහ ඒකකයක විකුණුම් මිල රු.2,000/- ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉන්පසු, විකුණුම් මිල සහ විචල්‍ය පිරිවැය වාර්ෂිකව ඇස්තමේන්තුගත 5% ක උද්ධමන අනුපාතිකයට සමගාමීව ඉහළ යනු ඇත. ක්ෂය හැර ව්‍යාපෘතියේ ස්ථාවර පිරිවැය, වර්ෂයකට රු. මිලියන 12 කි. යන්ත්‍රය, ප්‍රයෝජනවත් ආයු කාලය තුළ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය අය කරනු ලබන අතර, බදු අරමුණු සඳහා වන ප්‍රාග්ධන දීමනාව වසරකට 25% ක් වේ.

ඉදිරි වසර 4 සඳහා, පහත සඳහන් ප්‍රමාණයන් නිෂ්පාදනය කර අලෙවි කිරීමට අපේක්ෂා කෙරේ:

	1 වන වසර	2 වන වසර	3 වන වසර	4 වන වසර
ඒකක ගණන	180,000	235,000	260,000	200,000

(3) සමාගම, වාර්ෂිකව 30% ක අනුපාතිකයකින් ආදායම් බදු ගෙවන අතර, එය එම වර්ෂය තුළදීම ගෙවිය යුතු වේ.

(සමාගමේ ප්‍රාග්ධන පිරිවැය 15% කි.)

ඔබ විසින් කළ යුතු දෑ:

(a) පහත ඒවායේ ශුද්ධ වර්තමාන අගය [Net Present Value (NPV)] **ගණනය කරන්න**:

(i) **A ව්‍යාපෘතිය**.

(ii) **B ව්‍යාපෘතිය**. (ලකුණු 12)

(b) **A ව්‍යාපෘතිය** සහ **B ව්‍යාපෘතිය** අතුරෙන් හොඳම ආයෝජන විකල්පය **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 15)

09 වන ප්‍රශ්නය

සීමාසහිත Rocky සමාගම, Z නිෂ්පාදිතය නිපදවා අලෙවි කිරීමේ යෙදී සිටී. පහත සඳහන් තොරතුරු ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් උපුටාගෙන ඇත:

	රු. (ඒකකයකට)
සෘජු ද්‍රව්‍ය:	
X ද්‍රව්‍ය (කිලෝග්‍රෑමයක් රු.700/- බැගින් කිලෝග්‍රෑම් 0.1 ක්)	70
Y ද්‍රව්‍ය (කිලෝග්‍රෑමයක් රු.1,000/- බැගින් කිලෝග්‍රෑම් 1.9 ක්)	1,900
සෘජු ශ්‍රමය (පැයකට රු.2,000/- බැගින්)	500
විචල්‍ය පොදුකාර්ය (පැයකට රු.600/- බැගින්)	150
මූළු විචල්‍ය පිරිවැය	**2,620**
විකුණුම් මිල	3,200
දායකය	**580**

2025 දෙසැම්බර් මාසය සඳහා, ඒකක 80,000 ක් විකිණීමට සමාගම, අයවැයගත කර ඇති අතර, මාසයක් සඳහා අයවැයගත ස්ථාවර පොදුකාර්ය පිරිවැය රු.14,000,000/- ක් වේ.

2025 දෙසැම්බර් මාසය සඳහා සත්‍ය නිෂ්පාදනය / විකුණුම් ප්‍රමාණය, ඒකක 74,600 ක් වන අතර, සත්‍ය කාර්යසාධනය පහත සඳහන් පරිදි වේ:

	රු.
විකුණුම් ආදායම (ඒකක 74,600)	246,180,000
සෘජු ද්‍රව්‍ය:	
X ද්‍රව්‍ය (කිලෝග්‍රෑම් 8,200)	5,658,000
Y ද්‍රව්‍ය (කිලෝග්‍රෑම් 154,700)	166,302,500
සෘජු ශ්‍රම පිරිවැය (පැය 19,100)	34,380,000
විචල්‍ය පොදුකාර්ය	11,842,000
ස්ථාවර පොදුකාර්ය	15,250,000

කළමනාකරණය විසින් 2025 දෙසැම්බර් මාසය සඳහා පහත සඳහන් විචලනයන් ගණනය කර ඇත:

	රු.	
සෘජු ශ්‍රම අනුපාත විචලනය	3,820,000	වාසි
සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලනය	900,000	අවාසි
විකුණුම් ආන්තික පරිමා විචලනය	3,132,000	අවාසි
විචල්‍ය පොදුකාර්ය වියදම් විචලනය	382,000	අවාසි
විචල්‍ය පොදුකාර්ය කාර්යක්ෂමතා විචලනය	270,000	අවාසි
ස්ථාවර පොදුකාර්ය වියදම් විචලනය	1,250,000	අවාසි

ඔබ විසින් කළ යුතු දෑ:

(a) පහත සඳහන් විචලනයන් **ගණනය කරන්න**:

(i) විකුණුම් මිල විචලනය (Sales Price Variance). (ලකුණු 02)

(ii) ඍජු ද්‍රව්‍ය මිල විචලනය (Direct Material Price Variance). (ලකුණු 02)

(iii) ඍජු ද්‍රව්‍ය මිශ්‍රණ විචලනය (Direct Material Mix Variance). (ලකුණු 03)

(iv) ඍජු ද්‍රව්‍ය ඵලදා විචලනය (Direct Material Yield Variance). (ලකුණු 03)

(b) අයවැයගත දායකය, සත්‍ය දායකය සමඟ සැසඳීම සඳහා මෙහෙයුම් ප්‍රකාශනයක් **පිළියෙල කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 15)

10 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත Champ සමාගම,** අඛණ්ඩ පෙරසැරි ක්‍රියාවලි කිහිපයක් හරහා නිෂ්පාදිත නිපදවයි. 2025 දෙසැම්බර් මාසය තුළදී, **3 වන පෙරසැරියට** කළ යෙදවුම් පහත සඳහන් පරිදි වේ:

	රු.
2 වන පෙරසැරියෙන් මාරුකළ යෙදවුම් (ලීටර් 40,000)	16,000,000
ඍජු ශ්‍රමය	11,200,000
විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය	3,200,000

2025 දෙසැම්බර් මස ආරම්භයේදී, ලීටර් 3,200 ක ආරම්භක නොනිමි තොගයක් පැවති අතර, සම්පූර්ණ කිරීමේ මට්ටම් පහත සඳහන් පරිදි විය:

අමු ද්‍රව්‍ය	100% ක් සම්පූර්ණ කර ඇති අතර, වටිනාකම රු.680,000/- කි.
ඍජු ශ්‍රමය	80% ක් සම්පූර්ණ කර ඇති අතර, වටිනාකම රු.164,600/-කි.
විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය	50% ක් සම්පූර්ණ කර ඇති අතර, වටිනාකම රු.60,306/-කි.

2025 දෙසැම්බර් මාසය අවසානයේදී පැවති අවසාන නොනිමි තොගය ලීටර් 7,000 ක් වූ අතර, එහි සම්පූර්ණ කිරීමේ මට්ටම් පහත සඳහන් පරිදි විය:

අමු ද්‍රව්‍ය	100%
ඍජු ශ්‍රමය	60%
විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය	40%

මාසය අවසානයේදී, ලීටර් 32,500 ක්, නිමි භාණ්ඩ ලෙස මාරුකරන ලදී.

සාමාන්‍ය අපතය **2 වන පෙරසැරියෙන්** මාරු කළ යෙදවුම් ද්‍රව්‍යවලින් 8% ක් වන අතර, සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය, ලීටරයකට රු.250/- ක් බැගින් වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) සමානුපාතික ඒකක සහ පිරිවැය දැක්වෙන ප්‍රකාශනය **පිළියෙල කරන්න.** (ලකුණු 06)

(b) **3 වන පෙරසැරි ගිණුම පිළියෙල කරන්න.** (ලකුණු 08)

(B) **සීමාසහිත Goodie සමාගම** විසින් තම නිෂ්පාදිත පරාසයට තෝරාගත් නිෂ්පාදිත තුනක් අතුරෙන් නව නිෂ්පාදිතයක් හඳුන්වාදීමට සලකා බලමින් සිටී.

තෝරාගත් නිෂ්පාදිත තුනෙහි තොරතුරු පහත සඳහන් පරිදි වේ:

නිෂ්පාදිතය	**G**	**H**	**I**
විකුණුම් / නිෂ්පාදනය ඒකකවලින්:			
ඉහළ	1,000,000	2,000,000	800,000
මධ්‍යම	800,000	1,500,000	720,000
පහළ	600,000	1,200,000	650,000
විකුණුම් මිල (ඒකකයකට රු.)	300	180	700
විචල්‍ය පිරිවැය (ඒකකයකට රු.)	220	130	600

ඉහත සඳහන් දෑ වලට අමතරව, විකුණුම් ප්‍රමාණය ඒකක 700,000 කට වඩා වැඩි වේ නම්, විකුණන ලද ඒකක ගණන සඳහා ඒකකයකට විකුණුම් මිලෙන් 5% කට සමාන දිරි දීමනාවක් ගෙවනු ලැබේ. විකුණුම් ප්‍රමාණය ඒකක 900,000 ක් ඉක්මවූ පසු විකුණන ලද ඒකක ගණන සඳහා ඒකකයකට, විකුණුම් මිලෙන් 10% ක දිරි දීමනාවක් ගෙවනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) ඉහත තීරණ සඳහා වන දායකත්වය දක්වමින් ගෙවුම් වගුවක් (payoff table) **පිළියෙල කරන්න**. (ලකුණු 04)

(b) Maximax තීර්ණායකය යටතේ කුමන නිෂ්පාදිතය හඳුන්වාදිය යුතුදැයි **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 20)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
දැනුම (1)	තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම	**අඳින්න**	හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම.
		සම්බන්ධ කරන්න	තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම.
		සඳහන් කරන්න	ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම.
		හඳුනා දක්වන්න	සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම.
		ලැයිස්තුගත කරන්න	විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
අවබෝධය (2)	අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම.	**හඳුනාගන්න**	අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම.
		අර්ථකතනය කරන්න	වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න.
		විස්තර කරන්න	ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න.
		පැහැදිලි කරන්න	අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම.
		නිර්වචනය කරන්න	ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
භාවිතය (3)	අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම.	**සසඳන්න**	තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න.
		ප්‍රස්තාර දක්වන්න	ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න.
		තක්සේරු කරන්න	වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න.
		විසඳන්න	ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම.
		පිළියෙල කරන්න	විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම.
		ප්‍රදර්ශනය කරන්න	උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම.
		ගණනය කරන්න	ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම.
		භාවිත කරන්න	ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
විශ්ලේෂණය (4)	අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම.	**සන්නිවේදනය කරන්න**	තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම.
		සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.
		අසමානතා බලන්න	අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම.
		සමානකම් බලන්න	සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම.
		විමසන්න	තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම.
		වෙනස්කොට දක්වන්න	යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම.
		විශ්ලේෂණය කරන්න	විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න.